සියලුම හිමිකම් ඇවිරිණි/ All Right Reserved

සියලුම හිමිකම් ඇවිරිණි/முழுப் பதிப்புரிமையுடையது/All Rights Reserved

දකුණු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
தென் மாகாணக் கல்வித் திணைக்களம்
Department of Education, Southern Province

12 ශ්‍රේණිය අවසාන වාර පරීක්ෂණය - 2024 (2025)
தரம் 12 ஆண்டிறுதிப் பரீட்சை - 2024 (2025) Grade 12 Final Term Test - 2024 (2025)

| ගිණුම්කරණය | 33 | S | 1 | කාලය / நேரம் / Time | පැය 2 |
|---|---|---|---|---|---|

නම / பெயர் / Name ..............................................................  විභාග අංකය / சுட்டிலக்கம் / Index No. ....................................

උපදෙස් -

- සියලු ප්‍රශ්න වලට මෙම පත්‍රයේම පිළිතුරු සපයන්න.
- ප්‍රශ්න අංක 1 සිට 30 තෙක් වූ ප්‍රශ්ණ සඳහා නිවැරදි පිළිතුර තෝරා එහි අංකය ඉදිරියෙන් ඇති තිත් ඉර මත ලියන්න.
- ප්‍රශ්න අංක 31 සිට 50 දක්වා වූ ප්‍රශ්න සඳහා කෙටි පිළිතුරු අදාළ තිත් ඉර මත ලියන්න.
- සෑම ප්‍රශ්නයකටම සමාන ලකුණු හිමිවේ
- වැඩසටහන් සම්පාදනය කල නොහැකි ගණක යන්ත්‍ර භාවිතයට අවසර දෙනු ලැබේ.

---

01) මූල්‍ය ගිණුම්කරණයේ මූලික අරමුණ වඩාත් නිවැරදිව දැක්වෙන ප්‍රකාශය වන්නේ,

1. ව්‍යාපාරයකට ඇල්මක් දක්වන අභ්‍යන්තර පාර්ශවයන්ට තීරණ ගැනීමට අවශ්‍ය තොරතුරු සැපයීම වේ.
2. ව්‍යාපාරයකට ඇල්මක් දක්වන බාහිර පාර්ශ්වයන්ට තීරණ ගැනීමට අවශ්‍ය මූල්‍ය සහ මූල්‍ය නොවන තොරතුරු සැපයීම වේ.
3. නෛතික අවශ්‍යතා ඉටුකිරීම සඳහා ව්‍යාපාරයක අතීත මෙන්ම පුරෝකතන තොරතුරු සැපයීම වේ.
4. ව්‍යාපාරයකට ඇල්මක් දක්වන පාර්ශ්වයන්ට තීරණ ගැනීමට අවශ්‍ය මූල්‍ය තොරතුරු සැපයීම වෙයි.
5. ව්‍යාපාරයකට ඇල්මක් දක්වන බාහිර පාර්ශවයන්ට ඔවුන්ගේ අවශ්‍යතාවය මත මූල්‍ය මෙන්ම මූල්‍ය නොවන ඓතිහාසික තොරතුරු සැපයීම වේ. (...............)

- පහත තොරතුරු උපයෝගී කරගනිමින් ප්‍රශ්න අංක 02 සිට 05 දක්වා පිළිතුරු සපයන්න.
- චතුමිණි විසින් 2024-03-01 දින ආරම්භ කරන ලද ඇඟලුම් මිලට ගෙන විකිණීමේ ව්‍යාපාරයේ 2024 මාර්තු මාසය තුළ සිදුවූ ගනුදෙනු පහත දී ඇත.

03-01 මුදලින් රු 800 000 ක සහ රු 500 000 ක යන්ත්‍ර ප්‍රාග්ධනය ලෙස යොදා කුලියට ගත් ගොඩනැගිල්ලක ව්‍යාපාරය ආරම්භ කිරීම

03-05 රු 500 000 ක ඇඟලුම් මිලදීගෙන ඉන් රු 100 000ක් ගෙවා ඉතිරිය පසුව ගෙවීමට එකඟවීම

03-08 වාර්ෂික ගොඩනැගිලි කුලී රු 240 000 ගෙවීම

03-12 රු 300 000 ක් පිරිවැය වූ ඇඟලුම් පිරිවැයට 50% ක ලාභයක් සහිතව ණයට විකිණීම.

03-18 10% ක වට්ටමක් අඩුකර ණයහිමියන්ට රු 225 000 ක් ගෙවීම.

03-31 සේවක වැටුප් රු 15 000ක් චතුමිණි තම පෞද්ගලික මුදලින් ගෙවීම

අතිරේක තොරතුරු

- ව්‍යාපාරයේ යන්ත්‍ර වාර්ෂිකව 12% බැගින් පිරිවැය මත සරල මාර්ග ක්‍රමයට ක්ෂය කරයි

02) චතුමිණී ව්‍යාපාරයේ 2024 මාර්තු 01 සහ මාර්තු 05 යන දිනයන්හිදී සිදුවූ ගනුදෙනු සටහන් කිරීමට යොදා ගන්නා මූලාශ්‍ර ලේඛන පිළිවෙලින් ඇතුළත් පිළිතුර වන්නේ,

1. ලදුපත , ඉන්වොයිසිය , ගෙවීම් වවුචරය , ජ'නල් වවුචරය ,
2. ජ'නල් වවුචරය , ඉන්වොයිසිය , ගෙවීම් වවුචරය , හරපත
3. ඉන්වොයිසිය , ලදුපත , ගෙවීම් වවුචරය , ඉන්වොයිසිය
4. ජ'නල් වවුචරය , ගෙවීම් වවුචරය , ඉන්වොයිසිය , ලදුපත
5. ලදුපත , ජ'නල් වවුචරය , ගෙවීම් වවුචරය , ඉන්වොයිසිය (...............)



iexamhub
www.iexamhub.com
Your Trusted Partner for Exam Success
Past Papers Model Answers - Study Resources

03) චතුමිණී ව්‍යාපාරයේ 2024 මාර්තු 08 සිට මාර්තු 18 දක්වා සිදුවූ ගනුදෙනු සටහන් කිරීමට යොදා ගන්නා මූලික පොත් පිළිවලින් දැක්වෙන පිළිතුර වන්නේ,

1. මුදල් ගෙවීම් ජ'නලය , විකුණුම් ජ'නලය , පොදු ජ'නලය
2. මුදල් ගෙවීම් ජ'නලය , විකුණුම් ජ'නලය , මුදල් ගෙවීම් ජ'නලය
3. පොදු ජ'නලය , විකුණුම් ජ'නලය , මුදල් ගෙවීම් ජ'නලය
4. මුදල් ගෙවීම් ජ'නලය , ගැනුම් ජ'නලය , විකුණුම් ජ'නලය
5. පොදු ජ'නලය , විකුණුම් ජ'නලය , මුදල් ලැබීම් ජ'නලය (...............)

04) චතුමිණී ව්‍යාපාරයේ 2024-03-31 දිනෙන් අවසන් මාසය සඳහා ලාභය නිවැරදිව දැක්වෙන පිළිතුර වන්නේ,

1.රු 155 000 කි 2.රු 135 000 කි 3.රු 175 000 කි

4.රු 160 000 කි 5.රු 140 000 කි (...............)

05) චතුමිණී ව්‍යාපාරයේ 2024-03-31 දිනට ඉහත සියලු ගනුදෙනු සිදුවීමෙන් පසුව ගිණුම්කරණ සමීකරණය නිවැරදිව දැක්වෙන පිළිතුර වන්නේ,

| | වත්කම්(රු'000) | වගකීම්(රු'000) | හිමිකම්(රු'000) |
|---|---|---|---|
| 1. | 1595 | 150 | 1445 |
| 2. | 1585 | 150 | 1435 |
| 3. | 1605 | 150 | 1455 |
| 4. | 1685 | 250 | 1435 |
| 5. | 1600 | 150 | 1450 |

(..........)

පහත තොරතුරු උපයෝගී කරගනිමින් ප්‍රශ්න අංක 06 සිට 08 දක්වා පිළිතුරු සපයන්න.

- විහඟ නිමිසර ව්‍යාපාරයේ 2024-04-01 දිනට මුදල් පාලන ගිණුම අනුව වන ශේෂය රු 860 000 ක් වූ අතර එදිනට බැංකු ප්‍රකාශනය අනුව ශේෂය ඊට සමාන නොවුනි. එදිනට ශේෂයන් අතර වෙනසට එකම හේතුව වූයේ රු 140 000 ක නිකුත් කළ චෙක්පත් ගෙවීම් සඳහා ඉදිරිපත් නොවීම පමණි.
- 2024 අප්‍රේල් මාසය තුළ මුදල් ලැබීම් ජ'නලයේ එකතුව රු 1 260 000 ක් වූ අතර මුදල් ගෙවීම් ජ'නලයේ එකතුව රු 800 000 කි.
- 2024 අප්‍රේල් මාසය සඳහා බැංකු ප්‍රකාශය ලද පසුව සිදුකළ පරීක්ෂාවක දී අනාවරණය වූයේ සෘජු ණයගැති ප්‍රේෂණ රු 160 000 ක් , ස්ථාවර නියෝග මත ගෙවූ ණය වාරික 40 000 ක් සහ බැංකු ගාස්තු රු 5 000 ක් ව්‍යාපාරය ගිණුම් ගත කර නොතිබූ බවයි.
- 2024-03-31 දිනට තැන්පත් කළ නමුත් නිෂ්කාශනය නොවූ චෙක්පත්වල වටිනාකම රු 200 000 ක් සහ නිකුත් කළ නමුත් ගෙවීමට ඉදිරිපත් නොවූ චෙක් රු 60 000 ක් පමණක් තිබුණි

06) 2024-03-31 දිනට බැංකු ප්‍රකාශනය අනුව ශේෂය කොපමණද?

1.රු 900 000 කි 2.රු 1000 000 කි 3.රු720 000 කි

4.රු 1100 000 කි 5.රු 920 000 කි (...............)

07) 2024 - අප්‍රේල් 30 දිනට සංශෝධිත මුදල් පාලන ගිණුම අනුව ශේෂය කොපමණද?

1.රු 720 000 කි 2.රු 1230 000 කි 3.රු 1450 000 කි

4.රු 1320 000 කි 5.රු 1435 000 කි (...............)

08) 2024 අප්‍රේල් 30 දිනට බැංකු ප්‍රකාශය අනුව ශේෂය කොපමණද?

1.රු 1390 000 කි 2.රු 1295 000 කි 3.රු 1860 000 කි

4.රු 1235 000 කි 5.රු 1285 000 කි (...............)

- පහත තොරතුරු උපයෝගී කරගනිමින් ප්‍රශ්න අංක 09 සහ 10 සඳහා පිළිතුරු සපයන්න

කවීන් ව්‍යාපාරයේ 2024 මාර්තු 31 දිනට පිළියෙල කළ ණයගැති පාලන ගිණුම අනුව ශේෂය රු 1440 000 ක් වුවද එදිනට ණය ගැති ශේෂ ලැයිස්තුව අනුව ශේෂය ඊට සමාන නොවීය. පසුව සිදු කළ ගිණුම් පරීක්ෂාවකදී පහත කරුණු වන ආවරණය විය.

1. රු 260 000 ක විකුණුම් ඉන්වොයිසියක් ගිණුම්ගත කර නොතිබුණි.
2. රු 30 000 ක ආපසු එවුම් ණයගැති පබසරගේ ගිණුමේ සටහන් කර නොතිබුණි.
3. ණයගැති රශීනාගෙන් ලද රු 120 000 ක චෙක්පත අගරුවීම පිළිබඳ පොදු ලෙජරයේ ලියා නොතිබුණි.

09) කවීන් ව්‍යාපාරයේ 2024-03-31 දිනට සංශෝධිත ණයගැති පාලන ගිණුම අනුව ශේෂය කොපමණද?

1. රු 1580 000 කි
2. රු 1560 000 කි
3. රු 1820 000 කි
4. රු 1300 000 කි
5. රු 1590 000 කි (...............)



www.iexamhub.com
Your Trusted Partner for Exam Success
Past Papers Model Answers - Study Resources
iexamhub

10) කවීන් ව්‍යාපාරයේ සංශෝධනයට පෙර ණයගැති ශේෂ ලැයිස්තුව අනුව ශේෂය කොපමණද?

1.රු 1850 000 කි  2.රු 1560 000 කි  3.රු 2080 000 කි

4.රු 2030 000 කි  5.රු 1590 000 කි  (...............)

11) පහත දැක්වෙන ගිණුම්කරණ වැරදි අතරින් ශේෂ පිරික්සුමේ සමානතාවයට බල නොපාන වැරදි පමණක් ඇතුලත් පිළිතුර වන්නේ,

A. රු 80 000 ක හරපතක් ගිණුම් ගත නොතිබීම.
B. රු 120 000 ක ගැනුම් ඉන්වොයිසියක් දෙවරක් සටහන් කර තිබීම
C. රු 30 000 ක ණයහිමි ශේෂ මත පොලී ගැලපීම උපලෙජරයේ පමණක් සටහන් කිරීම.
D. මුදල් ලැබීම් ජ'නලයේ වට්ටම් තීරුවේ එකතුව රු 70 000 ක් ණයහිමි පාලන ගිණුමට බැර කිරීම( අදාළ අනෙක් ගිණුම් නිවැරදිව සටහන් කර ඇත)

1. A හා B පමණි.  2. A B හා C පමණි.  3. B හා C පමණි.
4. B C හා D පමණි.  5. A B C හා D සියල්ලම.  (...............)

12) ව්‍යාපාරයකට සම්පත් යොදවනු ලබන පාර්ශවයන්ගෙන් වෙන් වූ ස්වාධීන පැවැත්මක් ව්‍යාපාරයකට ඇති බව දැක්වෙන ගිණුම්කරණ සංකල්පය වන්නේ,

1. යථාරූපී සංකල්පය  2. විචක්ෂණ සංකල්පය  3.ගිණුම්කරණ ඒකක සංකල්පය

4.මුල්‍ය මිනුම් සංකල්පය  5.කාලච්ඡේද සංකල්පය  (...............)

13) ව්‍යාපාරයක අවසන් තොගය පිරිවැය හා ශුද්ධ උපලබ්ධි අගය යන අගයන්ගෙන් වඩාත් අඩු අගයට දැක්වීම තුළින් ආරක්ෂාවන ගිණුම්කරණ සංකල්පය සහ කඩවන ගිණුම්කරණ සංකල්පය නිවැරදිව දැක්වෙන පිළිතුර වන්නේ,

| | ආරක්ෂාව වන සංකල්පය | කඩවන සංකල්පය |
|---|---|---|
| 1. | ඓතිහාසික පිරිවැය සංකල්පය | විචක්ෂණය සංකල්පය |
| 2. | යථාරූපී සංකල්පය | විචක්ෂණ සංකල්පය |
| 3. | ගැලපුම් සංකල්පය | ඓතිහාසික පිරිවැය සංකල්පය |
| 4. | විචක්ෂණ සංකල්පය | ගැලපුම් සංකල්පය |
| 5. | විචක්ෂණ සංකල්පය | ඓතිහාසික පිරිවැය සංකල්පය |

(...............)

14) විෂයානුගත සංකල්පය අදහස වඩාත් නිවැරදිව දැක්වෙන ප්‍රකාශය වන්නේ,

1. ගනුදෙනුවක් ගිණුම්ගත කිරීමේ දී එහි නෛතික ස්වභාවය පිළිබඳ සැලකිලිමත් විය යුතු බවයි
2. ගනුදෙනුවක් ගිණුම්ගත කිරීමේදී එය සිදුවූ දින පැවැති අගයට හඳුනාගත යුතු බවයි
3. ගනුදෙනුවක් ගිණුම්ගත කිරීමේදී එහි නෛතික ස්වභාවය නොව ගිණුම්කරණ යථාර්ථය පදනම් කරගත යුතු බවයි.
4. ගනුදෙනුවක් එහි අයිතිකරුවන්ගෙන් වෙන් කර ව්‍යාපාරයේ කෝණයෙන් හඳුනා ගැනීම සිදු කල යුතු බවයි.
5. ගනුදෙනුවක් ගිණුම්ගත කිරීමේ දී ගිණුම්කරණ සංකල්ප වලට පමණක් අනුකූල විය යුතු බවයි.

(...............)

15) මුල්‍ය ප්‍රකාශවල මූලිකාංග සඳහා අදාළ ගිණුම නිවැරදිව දැක්වෙන පිළිතුර වන්නේ,

| | වත්කම් | වගකීම් | හිමිකම් | වියදම් |
|---|---|---|---|---|
| 1. | ඉඩම් | යන්ත්‍ර ණය | කොමිස් ආදායම | ගැනිලි |
| 2. | යන්ත්‍ර | වෙළෙඳ ගෙවිය යුතු දෑ | ගැනිලි | ගැණුම් |
| 3. | උපකරණ | බැංකු ණය | ලාභාංශ ආදායම | විදුලි ගාස්තු |
| 4. | තොගය | ණය පොලී | ප්‍රාග්ධනය | වරිපනම් |
| 5. | ගැනුම් | බැංකු ණය | ප්‍රාග්ධනය | රක්ෂණ ගාස්තු |

(...............)

16) මුල්‍ය තත්ත්ව ප්‍රකාශනය තුළ දැක්වෙන මූලිකාංග නිවැරදිව දැක්වෙන පිළිතුර වන්නේ,

1. ආදායම් සහ වියදම්
2. ආදායම් , වත්කම් හා වියදම්
3. වත්කම් සහ වියදම්
4. වත්කම් , වගකීම් සහ හිමිකම්
5. විකුණුම් , වත්කම් සහ වගකීම්

(...............)



www.iexamhub.com
Your Trusted Partner for Exam Success
Past Papers  Model Answers - Study Resources
iexamhub

17) විශාඛාගේ ව්‍යාපාරයේ 2024-03-31 දිනට උපචිත විදුලි ගාස්තු රු 140 000 ක් පැවැති අතර 2023-03-31 දිනට පැවැති ඉදිරියට ගෙවූ විදුලි ගාස්තු රු 40 000 කි. වර්ෂය තුල ලද විදුලි බිල් පත් වල එකතුව රු 630 000 කි. 2024-03-31 න් අවසන් වර්ෂය තුළ මුදලින් ගෙවූ විදුලි ගාස්තු වටිනාකම කොපමණද ?

1. රු 450 000 කි 2.රු 490 000 කි 3.රු 730 000 කි
4. රු 530 000 කි 5. රු 790 000 කි (...............)

- පහත තොරතුරු උපයෝගී කරගනිමින් ප්‍රශ්න අංක 18 සහ 19 ට පිළිතුරු ලියන්න.
  සකුණිගේ ව්‍යාපාරයේ වෙළඳ ලැබිය යුතු ශේෂ සම්බන්ධයෙන් පහත තොරතුරු සපයා ඇත.

| | 2024-03-31 දිනට(රු'000) | 2023-03-31 දිනට (රු'000) |
|---|---|---|
| වෙළඳ ලැබිය යුතු ශේෂය | 1500 | 1200 |

- වර්ෂය තුළ ගිණුම් ගත කරන ලද වෙළෙඳ ලැබිය යුතු ශේෂ මත හානිකරන අලාභ වටිනාකම රු 160 000 ක් වන අතර කපා හරින ලද හානි කරන අලාභ ආපසු ලැබීම් රු 90 000 කි.
- ව්‍යාපාරය ප්‍රතිපත්තියක් ලෙස වෙළෙඳ ලැබිය යුතු දෑ මත අපේක්ෂිත හානිකරන අලාභ සඳහා 10% ඉඩ හැරීමක් සිදුකරයි.

18) සකුණිගේ ව්‍යාපාරයේ 2024-03-31 දිනට වෙළඳ ලැබිය යුතු ශේෂවල ධාරණ අගය කොපමණද ?

1.රු 1380 000 කි 2.රු 1500 000 කි 3.රු 1440 000 කි
4.රු 1350 000 කි 5.රු 1190 000 කි (...............)

19) සකුණිගේ ව්‍යාපාරයේ 2024-03-31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වෙලෙද ලැබිය යුතු හානිකරණ අලාභ වියදම කොපමණද? 1. රු 90 000 කි 2.රු 100 000 කි 3. රු 150 000 කි
4.රු 60 000 කි 5. රු 210 000 කි (...............)

20) ඕලන්මාගේ ව්‍යාපාරයේ පැවැති මෝටර් රථ පිළිබඳ පහත දොරතුරු අදාල වේ. (රු' 000)

- 2023-04-01 දිනට ධාරන අගය 4 000
- 2023-04-01 සමුච්චිත ක්ෂය 1 000
- 2023-12-31 දින මිලට ගත් මෝටර් රථයේ වටිනාකම රු 2 000 000 කි.
- ව්‍යාපාරයේ සියලුම මෝටර් රථ වාර්ෂිකව පිරිවැය මත 10% බැගින් ක්ෂය කරයි.

ඕලන්මා ව්‍යාපාරය 2024-03-31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මෝටර් රථ ක්ෂය වටිනාකම සහ 2024-03-31 දිනට මෝටර් රථවල ධාරණ අගය නිවැරදිව දැක්වෙන පිළිතුර වන්නේ,

| | මෝටර් රථ ක්ෂය | 2024-03-31 දිනට ධාරන අගය |
|---|---|---|
| 1. | 450 | 5450 |
| 2. | 550 | 5450 |
| 3. | 700 | 6300 |
| 4. | 650 | 6450 |
| 5. | 700 | 7000 |

(...............)

21) උවිඳු දිල්සරගේ ව්‍යාපාරය පිරිවැය මත 50% ක ලාභයක් සහිතව රු 1200 000 කට විකුණුම් මිල ලකුණු කරන ලද තොගයක් විකිණීම හෝ ආපසු එවීමේ පදනම මත යවා තිබූ අතර 2024-03-31 දිනෙන් ගිණුම් වර්ෂය අවසන් වන විට එම තොගයෙන් 25% ක් විකිණී නොමැති බව දැනුම් දී තිබුණි. මෙම ගණුදෙනුව ගිණුම් ගත කිරීම මගින් වෙළඳ ලැබිය යුතු වටිනාකම සහඅවසන් තොග වටිනාකමට සිදුකරන බලපෑම කොපමණද ? (ව්‍යාපාරය අවසන් තොගය භෞතිකව ගණනය කරන බව උපකල්පනය කරන්න)

| | වෙළඳ ලැබිය යුතු දෑ ශේෂ | අවසන් තොග ශේෂය |
|---|---|---|
| 1. | රු 900 000 ක් වැඩි වේ. | රු 300 000 ක් වැඩි වේ. |
| 2. | රු 600 000 ක් වැඩි වේ. | රු 200 000 ක් වැඩි වේ. |
| 3. | රු 800 000 ක් වැඩි වේ. | රු 300 000 ක් වැඩි වේ. |
| 4. | රු 900 000 ක් වැඩි වේ. | රු 200 000 ක් වැඩි වේ |
| 5. | රු 800 000 ක් වැඩි වේ | රු 400 000 ක් වැඩි වේ. |

(...............)



iexamhub www.iexamhub.com Your Trusted Partner for Exam Success Past Papers Model Answers - Study Resources

22) තිසුම් ව්‍යාපාරයේ VAT සඳහා ලියාපදිංචි ව්‍යාපාරයකි. VAT අනුපාතය 18% ක් වන අතර සියලුම ගැනුම් සහ විකුණුම් මත VAT අදාළ වේ. 2024 මාර්තු මාසයට අදාළව VAT සහිත වටිනාකම් පහත දී ඇත. (රු'000)

- අත්පිට විකුණුම් 2950
- ණයට විකුණුම් 3776
- ආපසු එවුම් 826
- ණයට ගැනුම් 2832
- 2024-03-01 VAT පාලන ගිණුම් බැර ශේෂය 500
- වර්ෂය තුල ගෙවූ VAT 508

2024-03-31 දිනට ගෙවිය යුතු වටිනාකම කොපමණද? ('000)

1.රු 460 2.රු760 3.රු 160
4.රු 690 5.රු 675 (...............)

- පහත තොරතුරු ඇසුරින් ප්‍රශ්න අංක 23 සහ 24 ට පිළිතුරු සපයන්න.

මධාර ව්‍යාපාරයේ පහත තොරතුරු සපයා ඇත.

| | 2024-03-31 දිනට ('000) | 2023-03-31 දිනට ('000) |
|---|---|---|
| • ප්‍රාග්ධනය | 2300 | 1700 |
| • රඳවා ගත් ඉපැයුම් | 620 | 440 |

මධාර විසින් 2024-03-31 දිනෙන් අවසන් වර්ෂය තුළ පෞද්ගලික ප්‍රයෝජනයට ලබා ගත් මුදල් සහ භාණ්ඩ වල වටිනාකම පිළිවලින් රු 150 000 ක් සහ රු 60 000 කි.

23) 2024-03-31 දිනෙන් අවසන් වර්ෂය තුළ මධාර ව්‍යාපාරය ඉපයූ ලාභය කොපමණද? (රු'000)

1. 440 2. 620 3. 390 4. 230 5. 180 (...............)

24) ඉහත මධාර ව්‍යාපාරයේ 2024-03-31 දිනෙන් අවසන් වර්ෂය තුළ දරන ලද මෙහෙයුම් වියදම් රු 220 000 ක් නම් දළ ලාභය කොපමණද? (වෙනත් ආදායම් නොමැති බව උපකල්පනය කරන්න)

1.රු 400 000 කි 2.රු 610 000 කි 3.රු 670 000 කි

4.රු 460 000 කි 5.රු 170 000 කි (...............)

- පහත තොරතුරු ඇසුරින් ප්‍රශ්න අංක 25 හා 26 සඳහා පිළිතුරු සපයන්න.

මයුමි ව්‍යාපාරයේ සේවක වේතන සම්බන්ධව පහත තොරතුරු අදාළ වේ . (රු'000)

| | |
|---|---|
| මූලික වැටුප | 4 000 |
| දීමනා | 1000 |

- ව්‍යාපාරය සේවක දළ වේතනය මත සේවකයාගෙන් සහ සේව්‍යාගෙන් 10% සහ 15% බැගින් සේවක අර්ථසාධක අරමුදලට (EPF) දායක වේ.
- සේවා නියුක්තීන්ගේ භාර අරමුදලට (ETF) සඳහා දායකය 3% කි.

25) මයුමි ව්‍යාපාරයේ EPF වියදම සහ ETF වියදම කොපමණද?

| | EPF වියදම(රු'000) | ETF(රු'000) |
|---|---|---|
| 1. | 500 | 100 |
| 2. | 600 | 120 |
| 3. | 1000 | 120 |
| 4. | 1250 | 150 |
| 5. | 750 | 150 |

(...............)



iexamhub
www.iexamhub.com
Your Trusted Partner for Exam Success
Past Papers Model Answers • Study Resources

26) සේවකයන්ට ගෙවූ ශුද්ධ වැටුප සහ ගෙවිය යුතු EPF වටිනාකම කොපමණද?

| | ශුද්ධ වැටුප (රු‘000) | ගෙවිය යුතු EPF(රු‘000) |
|---|---|---|
| 1. | 4250 | 750 |
| 2. | 4500 | 1250 |
| 3. | 3750 | 1250 |
| 4. | 3750 | 750 |
| 5. | 4250 | 1500 |

(...............)

27) තරුෂි නිෂ්පාදන ව්‍යාපාරයේ 2024-03-31 දිනෙන් අවසන් වර්ෂය සඳහා පහත තොරතුරු සපයා ඇත.

| | 2024-03-31(රු’000) | 2023-03-31(රු’000) |
|---|---|---|
| • අමුද්‍රව්‍ය තොග | 600 | 450 |
| • නොනිමි තොග | 320 | 220 |
| • නිමි තොග | 400 | 350 |

| | (රු’000) |
|---|---|
| • ඍජු ශ්‍රම පිරිවැය | 620 |
| • ඍජු වෙනත් පිරිවැය | 130 |
| • නිෂ්පාදන පොදුකාර්‍ය පිරිවැය | 440 |
| • වර්ෂය තුල අමු ද්‍රව්‍ය ගැනුම් | 1200 |

2024-03-31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මුළු නිෂ්පාදන පිරිවැය කොපමණද?(රු’000)

1.2240 2.2090 3.1940 4.2040 5.2140 (...............)

28) සිතුම් ක්‍රීඩා සමාජයේ පහත තොරතුරු සපයා ඇත.

- එක් අයකුගේ මාසික සාමාජික මුදල රු 500
- 2023-04-01 දිනට සාමාජිකයන් 50 ක් සිටි අතර 2023-10-01 දින නව සාමාජිකයින් 20 ක් ඇතුළත් වූ අතර ඔවුන් එදිනම වාර්ෂික සාමාජික මුදල ගෙවන ලදි.
- 2023-04-01 දිනට කලින් ලද සාමාජික මුදල් නොතිබූ අතර සාමාජිකයින් 5 දෙනෙකු මාස 4 ක් සඳහා මුදල් ගෙවා නොතිබිණි.
- 2024-03-31 දිනට හිඟමුහිඟ සාමාජික මුදල් නොතිබුණි.

සාමාජික මුදල් ආදායම සහ මුදලින් ලද සාමාජික මුදල් වටිනාකම කොපමණද?

| | සාමාජික මුදල් ආදායම (රු’000) | මුදලින් ලද සාමාජික මුදල(රු’000) |
|---|---|---|
| 1. | 360 | 400 |
| 2. | 300 | 360 |
| 3. | 330 | 390 |
| 4. | 420 | 300 |
| 5. | 360 | 430 |

(...............)

29) 1890 හවුල් ව්‍යාපාර ආඥා පණතේ 24 වගන්තිය අනුව හවුල් ව්‍යාපාරයක් සම්බන්ධව නිවැරදි ප්‍රකාශය වන්නේ,

1. හවුල්කරුවන්ගේ ප්‍රාග්ධන ශේෂ මත වාර්ෂිකව 5% ක පොලී ගෙවිය යුතු බවයි
2. හවුල්කරුවන් කළමනාකරණය සඳහා දායක වන විට වේතන ගෙවිය යුතු බවයි.
3. හවුල්කරුවකු විශ්‍රාම ගිය විට, ඔහුට ගෙවිය යුතු ශේෂය මත වාර්ෂිකව 5% ක පොලියක් ගෙවිය යුතු බවයි
4. හවුල් ව්‍යාපාරයක ලාභය හවුල්කරුවන් අතර සම සමව බෙදා හැරිය යුතු බවයි.
5. හවුල්කරුවන් යෙදූ ප්‍රාග්ධන අනුපාතයට ලාභ අලාභ බෙදා ගත යුතු බවයි. (...............)

30) මයුමි සහ ජනනි රු 1800 000 බැගින් ප්‍රාග්ධනය යොදා ආරම්භ කල හවුල් ව්‍යාපාරයේ 2024-03-31 දිනෙන් අවසන් වර්ෂය තුල ඉපයූ ලාභය රු 1600 000 කි.

- හවුල් ගිවිසුමේ පහත කොන්දේසි ඇතුළත් විය.
- ලාභ හෝ අලාභ මයුමි සහ ජනනී අතර 3 : 2 අනුපාතයට බෙදා ගැනීම
- මයුමිට මාසිකව රු 20 000 බ බැගින් වේතන ගෙවීම
- ප්‍රාග්ධන ශේෂ මත 10% පොලී ගෙවීම.



iexamhub
www.iexamhub.com
Your Trusted Partner for Exam Success
Past Papers Model Answers - Study Resources

වර්ෂය තුළ හවුල්කරුවන් රු 200 000 බැගින් ගැනිලි සිදුකර ඇත්නම් 2024-03-31 දිනට මයුමිගේ සහ ජනනිගේ ජංගම ගිණුම් ශේෂ කොපමණද?

| | මයුමි(රු'000) | ජනනි(රු'000) |
|---|---|---|
| 1. | 1050 | 350 |
| 2. | 980 | 720 |
| 3. | 780 | 850 |
| 4. | 1020 | 580 |
| 5. | 820 | 380 |

(...............)

31) පහත ප්‍රකාශ සත්‍ය නම් '' T'' සහ අසත්‍ය නම් ''F'' ලෙස දක්වන්න.

I. මූල්‍ය ගිණුම්කරණයේදී මෙන්ම කළමනාකරන ගිණුම්කරණයේදී 'ගිණුම්කරණ ප්‍රමිත' සහ 'ගිණුම්කරණ සංකල්ප' භාවිතා කිරීම අනිවාර්ය වේ. (...............)

II. ව්‍යාපාරයක හිමිකම් ඉහළ යාමට බලපානු ලබන ඕනෑම ගනුදෙනුවක් ව්‍යාපාරයේ ලාභය කෙරෙහි බලපානු ලබයි. (...............)

III. ගිණුම් කාලච්ඡේදයක් තුළ මුදල් ශේෂය ඉහළ ගොස් ඇත්නම් අනිවාර්යයෙන්ම ලාභ ලබා ඇති බව කිව හැකිය. (...............)

IV. යම් ගනුදෙනුවක ප්‍රතිඵලයක් ලෙස වගකීම් සහ හිමිකම් පමණක් එකවර ඉහළ යා නොහැකිය. (...............)

- ප්‍රශ්න අංක 32 හා 33 ට පිළිතුරු සැපයීමට පහත තොරතුරු භාවිතා කරන්න.

විහඟ නිම්සර ව්‍යාපාරයේ 2024-03-31 දිනෙන් අවසන් වර්ෂය සඳහා පහත තොරතුරු අදාළ වේ.

- වර්ෂය තුළ හිමිකමෙහි අඩුවීම රු 1 250 000 කි.
- වර්ෂය තුළ සිදුකළ මුළු විකුණුම් රු 2 100 000 ක් සහ මුළු මෙහෙයුම් වියදම් රු 1 200 000 කි.
- වර්ෂය තුළ සිදුකළ ගැනිලි සහ අමතර ප්‍රාග්ධනය පිළිවෙලින් රු 450 000 ක් සහ රු 250 000 කි.

32) 2024-03-31 දිනෙන් අවසන් වර්ෂය තුළ විහග නිම්සර ව්‍යාපාරය ඉපැයූ ලාභය හෝ අලාභය කොපමණද? (රු'000)

..............................................................................................................................................

33) 2024-03-31 දිනෙන් අවසන් වර්ෂය තුළ විකුණූ භාණ්ඩවල පිරිවැය කොපමණද? (රු'000)

..............................................................................................................................................

34) පහත දැක්වෙන ගනුදෙනු මගින් ගිණුම් කරන සමීකරණය කෙරෙහි සිදුකරන ශුද්ධ බලපෑම වැඩිවේද අඩුවේද යන්න වටිනාකමසහිතව දක්වන්න.

1. රු 100 000 ක ණය වාරිකය ගෙවූ අතර එහි ඇතුළත් පොලිය රු 10 000 කි.
2. විකිණීම සඳහා රු 500 000 ක තොග මිලදීගෙන ඉන් රු 200 000 ක් ගෙවා ඉතිරිය පසුව ගෙවීමට එකඟවීම.
3. 10% වට්ටමකට යටත්ව ණය හිමියන්ට රු 135 000 ක්,අයිතිකරු පෞද්ගලිකව මුදලින් ගෙවීම.
4. කාලච්ඡේදය සඳහා ලද විදුලි බිල රු 40 000 ක් වුවද මුදලින් ගෙවා තිබුණේ රු 30 000 කි.

| | වත්කම් | = | වගකීම් | + | හිමිකම් (රු'000) |
|---|---|---|---|---|---|
| 1. | ...................... | | ...................... | | ...................... |
| 2. | ...................... | | ...................... | | ...................... |
| 3. | ...................... | | ...................... | | ...................... |
| 4. | ...................... | | ...................... | | ...................... |

35) පහත දැක්වෙන ගනුදෙනු වාර්තා කිරීම සඳහා වඩාත්ම අදාළ වන ගිණුම්කරණ සංකල්පය දක්වන්න.

1. අයිතිකරුගේ නිවසේ විදුලි බිල ව්‍යාපාරය මුදලින් ගෙවීම. ව්‍යාපාරයේ වියදමක් ලෙස හඳුනා නොගැනීම.

..............................................................................................................................................

2. දේපල පිරියත සහ උපකරණ එහි ඵලදායි ජීව කාලය තුළ ක්‍රමානුකූලව වියදම් ලෙස හඳුනා ගැනීම.

..............................................................................................................................................



iexamhub
www.iexamhub.com
Your Trusted Partner for Exam Success
Past Papers Model Answers - Study Resources

3. වර්ෂ අවසාන තොගය විකිණීම සඳහා ඉදිරිපත් කළ තොගයේ පිරිවැයෙන් අඩුකර දැක්වීම.

.....................................................................................................................................

4. විකිණීම හෝ ආපසු එවීම පදනම මත යැවූ තොග, ඉඩ දී ඇති කාලය ඉකුත් වූ විට විකුණුම් ලෙස හඳුනා ගැනීම

.....................................................................................................................................

36) ලසඳිගේ ව්‍යාපාරයේ පහත තොරතුරු සපයා ඇත.

| | 2024-03-31 දිනට (රු'000) | 2024-02-28 දිනට (රු'000) |
|---|---|---|
| • බැංකු ප්‍රකාශනය අනුව ශේෂය | 4200 | 2300 |
| • සංශෝධිත මුදල් පාලන ගිණුම අනුව ශේෂය | 4600 | 1900 |

- 2024-02-28 දිනට තැන්පත් කළ නමුත් නිෂ්කාශනය නොවූ චෙක්පත්වල වටිනාකම රු 800 000 කි.
- 2024-03-31 දිනට නිකුත් කළ නමුත් ගෙවීම් සඳහා ඉදිරිපත් නොවූ චෙක්පත්වල මුළු වටිනාකම 1 600 000 කි.

I. 2024-02-28 දිනට නිකුත් කළ නමුත් ගෙවීම් සඳහා ඉදිරිපත් නොකළ චෙක්පත්වල වටිනාකම කොපමණද? (රු'000)
.....................................................................................................................................

II. 2024-03-31 දිනට තැන්පත් කළ නමුත් උපලබ්ධි නොවූ චෙක්පත්වල වටිනාකම කොපමණද? (රු'000)
.....................................................................................................................................

පහත තොරතුරු උපයෝගී කරගනිමින් ප්‍රශ්න අංක 37 සහ 38 සඳහා පිළිතුරු සපයන්න.

- තිමල්කා ව්‍යාපාරයේ 2024-03-31 දිනට පිළියෙළ කරන ලද ණයගැති ශේෂ ලැයිස්තුව අනුව ශේෂය රු 1 800 000 කි. එදිනට ණයගැති ශේෂ ලැයිස්තුව සහ ණයගැති පාලන ගිණුම අනුව වෙනසට හේතු පහත දී ඇත.
  1. රු 450 000 ක විකුණුම් ඉන්වොයිසියක් ණයගැති උපලෙජරයේ රු 540 000 ක් ලෙස ලියා ඇත.
  2. රු 120 000 ක ආපසු එවුම් ණයගැති පාලන ගිණුමේ ලියා නැත.
  3. ණයගැතියන්ගෙන් ලැබී අගරු වූ රු 150 000 ක චෙක් පතක් පිළිබඳ ගිණුම්ගත කර නැත.

37) සංශෝධනයට පෙර ණයගැති පාලන ගිණුම අනුව ශේෂය සහ සංශෝධනයට පෙර ණයගැති ශේෂ ලැයිස්තුව අනුව ශේෂය කොපමණද?

1. සංශෝධනයට පෙර ණයගැති පාලන ගිණුම අනුව ශේෂය(රු'000) - ..........................................................................
2. සංශෝධිත ණයගැති ශේෂ ලැයිස්තුවේ ශේෂය - (රු'000)..........................................................................................

38) ඉහත දැක්වෙන වැරදි නිවැරදි කිරීමට පෙර අවිනිශ්චිත ගිණුමේ පැවති ශේෂය කොපමණද? ( හර ද බැර ද යන්න දක්වන්න)

.....................................................................................................................................

39) පහත දැක්වෙන අයිතම අදාළ වන මූල්‍ය ප්‍රකාශන වන මූලිකාංගය දක්වන්න.

1. යන්ත්‍ර -.....................................................................................................................
2. උපචිත ආදායම් -.....................................................................................................................
3. අඩමාන ණය -.....................................................................................................................
4. ආපසු යැවුම් - .....................................................................................................................

40) ශානිගේ ව්‍යාපාරයේ 2024-03-31 දිනෙන් අවසන් වර්ෂය සඳහා පහත තොරතුරු සපයා ඇත. (රු'000)

| | |
|---|---|
| 2023-04-01 දිනට තොගය | 2200 |
| වර්ෂය තුළ සිදු කළ ගැනුම් | 4900 |
| 2024-03-31 දිනට තොගය | 1100 |

ව්‍යාපාරය විකුණුම් මිල මත 20% ලාභයක් සහිතව භාණ්ඩ අලෙවි කරයි නම් දළ ලාභය සහ විකුණුම් වටිනාකම කොපමණද?

1. දළ ලාභය (රු'000) - .....................................................................
2. විකුණුම් (රු'000) -.....................................................................



iexamhub
www.iexamhub.com
Your Trusted Partner for Exam Success
Past Papers Model Answers - Study Resources

41) සාරාගේ ව්‍යාපාරය 2023-10-01 දින වාර්ෂික කුලිය රු 4 00 000 ක් ගෙවීමට එකඟ වී ගොඩනැගිල්ලක් කුලියට දුන් අතර 2024-03-31 දිනෙන් ගිණුම් වර්ෂය අවසන් වන විට මාස කුලී 3 ක උපචිතව පැවතුණි.

1. 2024-03-31 දිනෙන් අවසන් වර්ෂය සඳහා හඳුනාගත් ගොඩනැගිලි කුලී ආදායම් කොපමණද? (රු'000)

   ........................................................................................

2. 2024-03-31 දිනට උපචිත ගොඩනැගිලි කුලී ආදායම ගිණුම්ගත කිරීමට අදාළ ජර්නල් සටහන දක්වන්න. (රු'000)

   ...................................................................

   ...................................................................

42) දිල්කිගේ ව්‍යාපාරය 2020-10-01 දිනට රු 2 200 000 ක පිරිවැයට යන්ත්‍රයක් මිලට ගත් අතර එහි සවි කිරීමේ පිරිවැය රු 300 000 කි. යන්ත්‍රයේ ඵලදායී ජීව කාලය වර්ෂ 8 ක් ලෙසත් සුන්බුන් අගය රු 500 000 ක් ලෙසත් ඇස්තමේන්තු කරන ලදී.

- 2024-03-31 දිනට යන්ත්‍රයේ ධාරණ අගය කොපමණද? ......................................................................
- 2024-03-31 දිනින් අවසන් වර්ෂයේ යන්ත්‍ර ක්ෂය වටිනාකම කොපමණද? ......................................................................

ප්‍ර ශ්න අංක 43 හා 44 සඳහා පිළිතුරු සැපයීමට පහත තොරතුරු භාවිතා කරන්න.

ලෝචන ව්‍යාපාරයේ 2024 ජනවාරි මාසය තුළ සිදුවූ ගනුදෙනු පහත දී ඇත.

- 01/01 - ප්‍රාග්ධනය ලෙස රු 500 000 ක් යොදා ව්‍යාපාරය ආරම්භ කිරීම
- 01/03 - මාස 3 ක ගොඩනැගිලි කුලී රු 120 000 ක් ගෙවීම
- 01/08 - විකිණීම සඳහා රු 400 000 ක තොග මිලට ගෙන ඉන් රු 100 000 ක් ගෙවා ඉතිරිය පසුව ගෙවීමට එකඟවීම.
- 01/13 - පිරිවැය රු 320 000 ක් වූ තොග රු 650 000 කට අත්පිට විකුණන ලදී .
- 01/20 - මාසය සඳහා සේවක වැටුප් රු 30 000 ක් ගෙවිය යුතුය
- 01/31 - 10% වට්ටමකට යටත්ව ණයහිමියන්ට රු 108 000 ක් ගෙවීම.

43) ලෝචන ව්‍යාපාරයේ 2024 ජනවාරි මාසය සඳහා ලාභය හෝ අලාභය කොපමණද?(රු.000)

..........................................................................................................................

44) ලෝචන ව්‍යාපාරයේ ජනවාරි 31 දිනට මුදල් ශේෂය සහ මුලු වත්කම්වල වටිනාකම කොපමණද?

1. මුදල් ශේෂය - ......................................................................
2. මුළු වත්කම් -......................................................................

45) ගීතිගේ ව්‍යාපාරයේ 2024-03-01 දින රු 1000 000 ක් පිරිවැය වූ තොග පිරිවැයට 25% ක ලාභයක් සහිතව විකිණීම හෝ ආපසු එවීමේ පදනම මත කුෂානි ව්‍යාපාරයට යවන ලදී.2024-03-31 දිනෙන් ගිණුම් වර්ෂය අවසන් වන විට එම තොගයෙන් අඩක් පමණක් විකුණා ඇති බව කුෂානි දැනුම් දී තිබුණි. මෙම ගනුදෙනුව ගිණුම්ගත කිරීම මගින් වර්ෂයේ ලාභයට සහ වෙළෙඳ ලැබිය යුතු ශේෂයට සිදුවන බලපෑම අඩුවේද වැඩිවේද යන්න, වටිනාකම් සහිතව දක්වන්න.

1. ලාභය - ......................................................................
2. වෙළෙඳ ලැබිය යුතු ශේෂය-......................................................................



iexamhub
www.iexamhub.com
Your Trusted Partner for Exam Success
Past Papers Model Answers - Study Resources

46) මතීෂ නිෂ්පාදන ආයතනයේ පහත තොරතුරු සපයා ඇත.

| | 2024-03-31 දිනට(රු'000) | 2023-03-31දිනට (රු'000) |
|---|---|---|
| • අමුද්‍රව්‍ය තොගය | 1200 | 1700 |
| • නොනිමි තොගය | 450 | 200 |
| • නිමි තොගය | 1400 | 900 |

- වර්ෂය තුළ අමුද්‍රව්‍ය මිලට ගැනුම් රු 4 800 000 කි.
- වර්ෂය සඳහා යන්ත්‍ර ක්‍රියාකරුවන්ගේ වේතන රු 1 300 000 කි.
- වර්ෂය සඳහා මුළු නිෂ්පාදන පොදුකාර්ය රු 3 200 000 කි.
- නොනිමි අගය කරන්නේ මුළු නිෂ්පාදන පිරිවැයට වේ.

1. ප්‍රාථමික පිරිවැය කොපමණද? (රු.000)...............................................
2. විකුණුම් පිරිවැය කොපමණද?.(රු000)........................................

47) තරු ගේ ව්‍යාපාරයේ විකිණීම ට තිබූ තොගයේ විකුණුම් මිළ රු.200000 කි. ගංවතුර තත්ත්වයක් මත තොගයෙන් 1/4 ක් හානී වී ඇත.තොග විකුණනු ලබන්නේ පිරිවැය ට 25% ක ලාභ ප්‍රතිශතයක් තබා ගෙනය.හානි වූ තොගයට අදාල ද්විත්ව සටහන වටිනාකම් සහිතව දක්වන්න.

..........................................................................................................................................

..........................................................................................................................................

48) 1890 හවුල් ව්‍යාපාර ආඥා පනතේ 24 වන වගන්තිය අනුව ලාභලාභ විසර්ජනය සම්බන්ධව වැදගත්වන කරුණු දෙකක් ලියන්න.

..........................................................................................................................................

..........................................................................................................................................

- පහත තොරතුරු ඇසුරින් ප්‍රශ්න අංක 49 සහ 50 ට පිළිතුරු සපයන්න.

සවීනා සහ විශාඛා විසින් 3:2 අනුපාතයට ලාභ හෝ අලාභ බෙදා ගනිමින් පවත්වාගෙන යනු ලැබූ හවුල් ව්‍යාපාරයට 2023-04-01 දින මිතිල නව හවුල්කරුවකු ලෙස බඳවා ගත් අතර නව ලාභ ලාභ අනුපාතය සවීනා විශාඛා සහ මිතිල අතර 3:2:1ලෙස එකග වී ඇත.

| | සවීනා | විශාඛා |
|---|---|---|
| 2023-04-01 දිනට ප්‍රාග්ධන ගිණුම් ශේෂ | 3000 | 4000 |
| 2023-04-01 දිනට ජංගම ගිණුම් ශේෂ | 700 | 400 |

මිතිල ප්‍රාග්ධනය ලෙස රැගෙන ආ මුදල රු 3 600 000

මිතිල බඳවාගන්නා දිනට ගණනය කළ කීර්ති නාමය රු 2 400 000

49) මිතිල බදවා ගන්නා දිනට කීර්ති නාමය ගිණුම්ගත කිරීම සඳහා අදාළ ජ'නල් සටහන දක්වන්න

..........................................................................................................................................

..........................................................................................................................................

..........................................................................................................................................

..........................................................................................................................................

..........................................................................................................................................

..........................................................................................................................................

50) සවීනා විශාඛා සහ මිතිල හවුල් ව්‍යාපාරයේ 2024-03-31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ඉපයූ ශුද්ධ ලාභය රු 1 500 000ක් නම් හා ඔවුන්ගේ හවුල් ගිවිසුම තුළ ප්‍රාග්ධන පොලී සහ හවුල් වේතන පිළිබඳ කිසිදු කොන්දේසියක් ඇතුළත් වී නොමැති නම් 2024-03-31 දිනට හවුල්කරුවන්ගේ මුළු හිමිකම වෙන වෙනම දක්වන්න.

- සවීනා (රු'000) ......................................................................
- විශාඛා (රු'000) ......................................................................
- මිතිල (රු'000) ......................................................................



www.iexamhub.com
Your Trusted Partner for Exam Success
Past Papers Model Answers - Study Resources
iexamhub

සියලුම හිමිකම් ඇවිරිණි/ All Right Reserved

සියලුම හිමිකම් ඇවිරිණි/முழுப் பதிப்புரிமையுடையது/All Rights Reserved

දකුණු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
தென் மாகாணக் கல்வித் திணைக்களம்
Department of Education, Southern Province

12 ශ්‍රේණිය අවසාන වාර පරීක්ෂණය - 2024 (2025)
தரம் 12 ஆண்டிறுதிப் பரீட்சை - 2024 (2025) Grade 12 Final Term Test - 2024 (2025)

| ගිණුම්කරණය | 33 | S | 2 | කාලය / நேரம் / Time | පැය 3 |
|---|---|---|---|---|---|

නම / பெயர் / Name ........................................ විභාග අංකය / சுட்டிலக்கம் / Index No. ..............................

උපදෙස් -

- අමතර කාලය මිනිත්තු 10
- පළමු ප්‍රශ්නය හා දෙවන ප්‍රශ්නය ඇතුළු ව ප්‍රශ්න පහකට පිළිතුරු ලියන්න.
- වැඩසටහන් සම්පාදනය කළ නොහැකි ගණක යන්ත්‍ර භාවිතයට අවසර දෙනු ලැබේ.

01) විහඟ සහ හිරුෂ පවත්වාගෙන යනු ලබන හවුල් ව්‍යාපාරයේ 2024.03.31 දිනට ශේෂ පිරික්සුම පහත දැක්වේ.

| විස්තරය | හර('000) | බැර('000) |
|---|---|---|
| ඉඩම් (පිරිවැයට)........................................ | 5 000 | |
| ගොඩනැගිලි (පිරිවැයට)........................................ | 3 500 | |
| යන්ත්‍ර (පිරිවැයට)........................................ | 2 200 | |
| සමුච්චිත ක්ෂය (2023.04.01 දිනට) | | |
| ගොඩනැගිලි........................................ | | 600 |
| යන්ත්‍ර........................................ | | 550 |
| වෙළෙඳ ලැබිය යුතු ගිණුම්........................................ | 1 800 | |
| වෙළඳ ගෙවිය යුතු ගිණුම්........................................ | | 600 |
| තොගය........................................ | 1 200 | |
| වේතන........................................ | 1 300 | |
| රක්ෂණ ගාස්තු........................................ | 450 | |
| ගොඩනැගිලි කුලී........................................ | 200 | |
| ප්‍රාග්ධන ගිණුම්(2023.04.01 දිනට) | | |
| විහඟ........................................ | | 3 000 |
| හිරුෂ........................................ | | 2 000 |
| සකුල් රැගෙන ආ මුදල........................................ | | 1 000 |
| ජංගම ගිණුම් (2023.04.01) | | |
| විහඟ........................................ | | 400 |
| හිරුෂ........................................ | | 300 |
| විහඟ ණය ගිණුම (2023.04.01 ලබා දුන්)........................................ | | 200 |
| කොමිස් ආදායම........................................ | | 150 |
| 10% බැංකු ණය (2023.10.01 දින ලබාගත්)........................................ | | 3 000 |
| උපචිත රක්ෂණ ගාස්තු........................................ | | 100 |
| විකුණුම්........................................ | | 21 200 |
| ගැනුම්........................................ | 12 000 | |
| යන්ත්‍ර අලුත් වැඩියා වියදම් ........................................ | 1 200 | |
| ගෙවිය යුතු EPF... ........................................ | | 100 |
| විකුනුම් කොමිස්........................................ | 800 | |
| මුදල්........................................ | 3 550 | |
| | <u>33 200</u> | <u>33 200</u> |



www.iexamhub.com
Your Trusted Partner for Exam Success
Past Papers Model Answers - Study Resources
iexamhub

- විහඟ සහ හිරුෂ හවුල් ව්‍යාපාර ගිවිසුම තුළ පහත කොන්දේසි ඇතුළත්ව තිබුණි.
  1. විහඟ සහ හිරුෂ අතර ලාභලාභ 3:2 අනුපාතය වේ.
  2. විහඟ ට සහ හිරුෂට මාසිකව රු 25 000 බැගින් වේතන ගෙවීම
  3. වර්ෂ ආරම්භයේ පවතින ප්‍රාග්ධන ශේෂය මත වාර්ෂිකව 10% පොලී ගෙවීම.

**අතිරේක තොරතුරු**

1. 2024.03.31 දිනට ඉතිරි තොගය පිරිවැයට රු 1 600 000 කි. ඉන් රු 500 000 ක් පිරිවැය වූ තොග අයිතමයක ශුද්ධ උපලබ්ධි අගය රු 350 000 ක් ලෙස ඇස්තමේන්තු කර ඇත.
2. 2024.03.31 දිනට උපචිත ප්‍රචාරණ වියදම් රු 230 000 ක් සහ උපචිත කොමිස් ආදායම රු 100 000 ක් පැවතුණි.
3. 2023.07.01 දින විහඟ සතු ගොඩනැගිල්ලක් ව්‍යාපාරයේ ප්‍රදර්ශනාගාරය පවත්වා ගැනීමට කුලියට ගෙන තිබුණි. ඒ සඳහා ගෙවීමට එකඟ වූ වාර්ෂික කුලිය රු 600 000කි. ඒ වෙනුවෙන් විහඟට ගෙවූ කුලිය ශේෂ පිරික්සුමෙහි ගොඩනැගිලි කුලී ලෙස සඳහන්ව ඇත.
4. ව්‍යාපාරය ඉඩම් හැර අනෙකුත් දේපල පිරියත සහ උපකරණ වාර්ෂිකව පිරිවැය මත 10% බැගින් සරල මාර්ග ක්‍රමයට ක්ෂය කරනු ලබයි.
   - 2023-10-01 දින මිලට ගත් රු 2 000 000 ක් වූ ගොඩනැගිලි පිළිබඳව නිවැරදිව ගිණුම්ගත කර තිබුණි
   - 2023.12.31 දින රු 800 000 ක් වැය කර යන්ත්‍රයක් මිලදීගෙන තිබූ අතර එය යන්ත්‍ර අලුත් වැඩියා වියදම් ලෙස සටහන් කර තිබුණි
5. වර්ෂය තුළ හවුල්කරුවන් සිදුකළ පහත දැක්වෙන භාණ්ඩ ගැනිලි පිළිබඳව ගිණුම් ගත කර නොතිබුණි.(රු'000)
   - විහඟ 120
   - හිරුෂ 230
6. විහඟ ට සහ හිරුෂට මාස 06 ක වේතන ගෙවා ඇති අතර එය ව්‍යාපාරයේ වේතන ලෙස දක්වා ඇත.
   - සේවක අර්ථසාධක අරමුදල(EPF) සහ සේවක දායකය 10% අඩුකර වැටුප් ගෙවා ඇති අතර ගෙවූ වැටුප් සහ EPF සේවක දායක ගිණුම්ගත කර තිබුණි. EPF සඳහා සේවා දායකය 15%ක් සහ සේවක භාරකාර අරමුදල(ETF) 3% පිළිබඳ ව ගිණුම් ගත කර නැත.
7. විහඟගේ පෞද්ගලික ජීවිත රක්ෂණ වාරිකය ලෙස ගෙවූ රු 100 000 ක් ව්‍යාපාරයේ රක්ෂණ ගාස්තු තුළ දක්වා ඇත.
8. 2024.03.31 දින සකුල් නව හවුල්කරුවකු ලෙස බඳවා ගත් අතර ඔහු රැගෙන ආ රු 1 000 000 ක මුදල ගිණුම්ගත කර ඇත. ඔහුගේ බඳවා ගැනීම වෙනුවෙන් ව්‍යාපාරය කීර්ති නාමය රු 1 200 000 ට තක්සේරු කරන ලදී.
9. නව හවුල් ගිවිසුම පහත පරිදි වේ.
   - විහඟ , හිරුෂ සහ සකුල් අතර ලාභ හෝ අලාභ ය 3:2:1 අනුපාතයට බෙදා හැරීම.
   - හවුල්කරුවන් තිදෙනාටම මසකට රු 25 000 බැගින් වේතන ගෙවීම.
   - වර්ෂ ආරම්භ ප්‍රාග්ධන ගිණුම් ශේෂ සඳහා වාර්ෂිකව 10% ක පොලී ගෙවීම.

**අවශ්‍ය වන්නේ ,**

1. 2024.03.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා විහඟ , හිරුෂ , සකුල් හවුල් ව්‍යාපාරයේ ලාභ හෝ අලාභ ප්‍රකාශනය (හවුල්කරුවන්ට සිදුකළ ලාභ හෝ අලාභ විසර්ජනයන්ද සහිතව)
2. 2024.03.31 දිනට විහඟ හිරුෂ සහ සකුල් හවුල් ව්‍යාපාරයේ මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය.

02)

මධාර විසින් 2024.03.01 දින රු 1 000 000 ක මුදල් සහ රු 1 500 000 ක මෝටර් රථය ප්‍රාග්ධනය ලෙස යොදවමින් ඇඟලුම් විකිණීමේ ව්‍යාපාරයක් කුලියට ගත් ගොඩනැගිල්ලක ආරම්භ කරන ලදී.

මාර්තු මාසය තුළ පහත ගනුදෙනු සිදුවී ඇත

03.02 - විකිණීම සඳහා රු 500 000 ක් පිරිවැය වූ ඇඟලුම් ණයට ගැනීම.

03.04 -රු 300 000 ක් පිරිවැය වූ තොග රු 500 000 කට ණයට විකිණීම

03.07 - රු 1 000 000 බැංකු ණය ලබාගැනීම.

03.10 -10% ක වට්ටමක් අඩු කිරීමෙන් පසුව වෙළෙඳ ලැබිය යුතු ශේෂ පියවීම සඳහා ලද මුදල රු 315 000කි.

03.15- රු 250 000 ක වෙළෙඳ ගෙවිය යුතු ශේෂ පියවීම සඳහා 10% ක වට්ටමකට යටත්ව මුදල් ගෙවීම.

03.18- මාර්තු සහ අප්‍රේල් මාස සඳහා ගොඩනැගිලි කුලි රු 100 000 ක් ගෙවීම.

03.22- මධාර තම පෞද්ගලික මුදලින් ව්‍යාපාරයේ සේවක වැටුප් රු 15 000 ක් ගෙවීම.

03.24- රු 20 000 ක කොමිස් ආදායමක් ලැබීම.

03.27- වෙළෙඳ ලැබිය යුතු ශේෂයන්ගෙන් රු 20 000ක් නිශ්චිතවම නොලැබෙන බැවින් හානි කරන අලාභ ලෙස හඳුනා ගැනීම.



www.iexamhub.com
Your Trusted Partner for Exam Success
Past Papers - Model Answers - Study Resources
iexamhub

03.29- ව්‍යාපාරයේ මුදලින් මධාර ගේ පෞද්ගලික ජීවිත රක්ෂණ වාරිකය රු 30 000 ක් ගෙවීම.

03.31- බැංකු ණය වාරිකය රු 60 000 ක් ගෙවූ අතර ඒ තුල රු 10 000 ක පොළී ඇතුළත් වේ.

අතිරේක තොරතුරු:

- මෝටර් රථයේ ඵලදායී ජීව කාලය වර්ෂ 10ක් ලෙසත් සුන් බුන් අගය රු 300 000 ක් ලෙසත් ඇස්තමේන්තුගත කර තිබුණි.
- 2024 මාර්තු මාසයේ සඳහා ලද විදුලි බිල රු 15 000 කි.
- මධාර පෞද්ගලික ප්‍රයෝජනයට ලබා ගත් තොගවල පිරිවැය රු 20 000 කි

අවශ්‍ය වන්නේ ,

1. 2024 මාර්තු 01 දින සිට මාර්තු 31 දින දක්වා සිදුවූ ගනුදෙනු ,පහත දැක්වෙන ගිණුම්කරණ සමීකරණයට සිදුවන බලපෑම, වැඩිවෙයි නම් (+) ද අඩුවේ නම්(-) ද ලෙස දැක්වීම.

| දිනය | වත්කම් | | | | | වගකීම් | | හිමිකම් | |
|---|---|---|---|---|---|---|---|---|---|
| | මෝ. රථ+ | තොග+ | වෙළඳ + ලැබිය යුතු දෑ | වෙනත්+ ජංගම වත්කම් | මුදල් = | බැංකු+ ණය | වෙළඳ+ ගෙවිය යුතු දෑ | ප්‍රාග්ධනය + | රඳවා ගත් ඉපැයුම් |
| | | | | | | | | | |

2. ඉහත අතිරේක තොරතුරු සැලකිල්ලට ගත් පසුව මධාර ගේ ව්‍යාපාරයේ 2024 මාර්තු මාසය සඳහා ඉපැයූ ලාභය ගණනය කිරීම.
3. 2024.03.31 දිනට තොගය, වෙළඳ ලැබිය යුතු ශේෂය සහ මෝටර් රථවල ධාරණ අගය ගණනය කිරීම.

03)තරුලි ගේ ලිපි ද්‍රව්‍ය ව්‍යාපාරය පැවති ගිණුම් ශේෂ සහ අප්‍රේල් මාසය තුළ සිදුවූ ගනුදෙනු පහත දී ඇත.

තරුලි ව්‍යාපාරය VAT සඳහා ලියාපදිංචි ව්‍යාපාරයක් වන අතර VAT අනුපාතය 18% කි. සියලුම වෙළඳ තොග ගැනුම් සහ විකුණුම් සඳහා VAT අදාළ වේ .

- 2024-04-01 දිනට ගිණුම් ශේෂ (රු’000)

| | |
|---|---|
| මුදල් | 1 300 |
| වෙළඳ ලැබිය යුතු ගිණුම් | 300 |
| වෙළඳ ගෙවිය යුතු ගිණුම් | 500 |
| තොගය | 300 |
| VAT පාලන ගිණුම(බැර) | 220 |

- 2024 අප්‍රේල් මාසය තුළ සිදුවූ ගනුදෙනු

04.02- තිවංක ව්‍යාපාරයෙන් විකිණීම සඳහා ලිපි ද්‍රව්‍ය ණයට ගැනීම.රු 180 000 කි (VAT රහිත වටිනාකම)

04.05- මෙත්මි ව්‍යාපාරයට රු 118 000 ක (VAT සහිත වටිනාකම) ලිපි ද්‍රව්‍ය අත්පිට මුදලට විකිණීම

04.08- අප්‍රේල් 02 දින තිවංකගෙන් ණයට ගත් ලිපි ද්‍රව්‍ය අපසු හරවා යැවීම.

04.10- කවීෂ් ව්‍යාපාරයෙන් VAT සහිත වටිනාකම රු 236 000 ක ලිපි ද්‍රව්‍ය ණයට ගැනීම.

04.12- තරුලි පෞද්ගලික ප්‍රයෝජනයරට රු 50 000 ක් ලබා ගැනීම.

04.14- VAT සඳහා රු 180 000 ක් ගෙවීම.

04.15- අප්‍රේල් 01 දිනට පැවති වෙළඳ ලැබිය යුතු ශේෂය පියවීම සඳහා 10% වට්ටමකට යටත්ව මුදල් ලැබීම

04.18- රු 472 000 ක VAT සහිත විකුණුම් මිල වූ තොග මෙත්මි ව්‍යාපාරයට ණයට විකිණීම.

04.20- රු 300 000 ක පරිගණකයක් මිලදී ගැනීම



www.iexamhub.com
Your Trusted Partner for Exam Success
Past Papers Model Answers - Study Resources
iexamhub

04.23- අප්‍රේල් 18 දින මෙත්මි ව්‍යාපාරයට විකුණූ තොග සඳහා ලැබිය යුතු මුදලින් අඩක් 10% වට්ටමකට යටත්ව ලැබීම.(VAT රහිත වටිනාකම මත වට්ටම් ලබා දේ.)

04.25- රශිත ව්‍යාපාරයෙන් භාණ්ඩ මිලදී ගැනීමට ගෙවූ අත්තිකාරම් මුදල රු.400 000 යි

04.26- VATරහිත වටිනාකම රු 300 000 ක් විකුණුම් මිල වූ තොග අමන්දි ව්‍යාපාරයට ණයට විකිණීම.

04.28- අප්‍රෙල් 25 දින රශිත ව්‍යාපාරයට ලබා දුන් අත්තිකාරම සඳහා VAT සහිත මිල රු.354000 ක තොග භාර දීම.

04.30- අප්‍රේල් 26 දින අමන්දි ව්‍යාපාරයට ණයට විකුණූ තොග වලින් VAT රහිත වටිනාකම රු. 100 000 ක් වූ තොග ආපසු එවීම.

**අවශ්‍ය වන්නේ:**

1. ඉහත ගනුදෙනුවට අදාළ මූලික පොත්වල සටහන් කිරීම
2. පහත දැක්වෙන ගිණුම් පිළියෙළ කිරීම
   (1). මුදල් පාලන ගිණුම
   (2). වෙළඳ ලැබිය යුතු පාලන ගිණුම
   (3). වෙළඳ ගෙවිය යුතු පාලන ගිණුම
   (4). VAT පාලන ගිණුම

04) 2023.0101 දින ආරම්භ කරන ලද "ශක්ති" ක්‍රීඩා සමාජයේ වර්ෂය තුළ සිදුවූ ගනුදෙනුවල සාරාංශයක් පහත දී ඇත.

| | (රු'000) |
|---|---|
| සාමාජික මුදල් ලැබීම | ? |
| පරිත්‍යාග ලැබීම | 500 |
| ආපනශාලා අත්පිට විකුණුම් | 320 |
| ණයට විකුණුම් | 160 |
| ඇතුළත් වීමේ ගාස්තු | 75 |
| ක්‍රීඩා උපකරණ මිලට ගැනීම | 1200 |
| තරග සංවිධාන වියදම්ගෙවීම | 20 |
| ආපනශාලාවේ අත්පිට ගැනුම් | 250 |
| ණයට ගැනුම් | 130 |
| ගොඩනැගිලි කුලී | 120 |
| විනිසුරු ගාස්තු | 25 |
| විදුලි ගාස්තු | 12 |
| ක්‍රීඩාංගනය සඳහා ගෙවූ කුලී | 130 |
| සේවක වැටුප් | 80 |

**අතිරේක තොරතුරු :**

1. ක්‍රීඩා සමාජය ආරම්භයේදී 2023.01.01 දින සාමාජිකයින් 100 ක්සාමාජිකත්වය ලබාගත් අතර තවත් සාමාජිකයින් 20 දෙනෙකු 2023.05.01 දින සාමාජිකත්වය ලබාගෙන තිබුණි. එක් සාමාජිකයෙකුගේ මාසික සාමාජික මුදල රු 1 000 කි.2023.12.31 දින වන විට සාමාජිකයින්15 දෙනෙකු මාස 06 ක මුදල් ගෙවා නොතිබුණි. තවත් සාමාජිකයින් 20 දෙනෙකු 2024 ජනවාරි සහ පෙබරවාරි මාස සඳහාද මුදල් ගෙවා තිබුණි.
2. වර්ෂය තුළ ලද පරිත්‍යාග වලින් 20% ක් මෙම වර්ෂයේ ආදායම ලෙස හඳුනාගත යුතුය.
3. ක්‍රීඩා සමාජයේ පරිපාලන කටයුතු පවත්වාගෙන යාම සඳහා 2023.04.01 දින ගොඩනැගිල්ලක් කුළියට ගත් අතර ඒ වෙනුවෙන් ගෙවූ වාර්ෂික කුලිය, ගොඩනැගිලි කුලී ලෙස දක්වා ඇත
4. 2023.07.01 ක්‍රීඩා උපකරණ මිලට ගත් අතර ඒවායේ ප්‍රයෝජනවත් ජීව කාලය වර්ෂ 5 ක් ලෙසත් සුන්බුන් අගයක් නොමැති බවත් ඇස්තමේන්තු කර ඇත
5. 2023.12.31 දිනට උපචිත විදුලි ගාස්තු රු 8 000 ක් සහ උපචිත විනිසුරු ගාස්තු රු 10 000 ක් විය.
6. 2023.12.31 දිනට ආපනශාලාවේ ඉතිරි තොගය රු 60 000 කි.



iexamhub
www.iexamhub.com
Your Trusted Partner for Exam Success
Past Papers Model Answers - Study Resources

7. 2023.12.31 දිනට ආපනශාලාවේ වෙලෙඳ ලැබිය යුතු ශේෂ රු 60 000 ක් සහ වෙළඳ ගෙවිය යුතු ශේෂ රු 80 000 ක් පැවතුණි.
8. සේවක වැටුප් වලින් රු 60 000 ක් ආපනශාලාව සඳහා අදාළ වන අතර 2023.12.31 දිනට උපචිත වැටුප් රු 30 000 කි.

**අවශ්‍ය වන්නේ:**

1. 2023.12.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ශක්ති ක්‍රීඩා සමාජයේ ලැබීම් හා ගෙවීම් ගිණුම
2. 2023.12.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ශක්ති ක්‍රීඩා සමාජයේ ආදායම් ප්‍රකාශනය
3. 2023.12.31 දිනට ශක්ති ක්‍රීඩා සමාජයේ මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය

05) මානෙත් ව්‍යාපාරය භාණ්ඩ නිෂ්පාදනය කර අලෙවි කිරීමද සිදුවෙමින් පවත්වාගෙන යන ව්‍යාපාරයක් වන අතර 2023.04.01 දිනට පහත තොරතුරු සපයා ඇත.

| | (රු'000) |
|---|---|
| 2023.04.01 දිනට අමුද්‍රව්‍ය තොග | 350 |
| නොනිමි තොග | 75 |
| නිමි ද්‍රව්‍ය තොග | 165 |
| අමුද්‍රව්‍ය මිලට ගැනුම් | 850 |
| අමුද්‍රව්‍ය ගෙන ඒමේ කුලී | 25 |
| අමුද්‍රව්‍ය ආපසු යැවුම් | 40 |
| ඇසුරුම් වියදම් | 35 |
| සෘජු වැටුප් | 275 |
| කම්හල් සුපරීක්ෂණ වේතන | 60 |
| විදුලිය | 75 |
| යන්ත්‍ර පිරිවැය (2021.04.01 මිලට ගත්) | 1 000 |
| යන්ත්‍ර අලුත් වැඩියා වියදම් | 35 |
| මෝස්තර නිර්මාණ වියදම් | 25 |
| අනෙකුත් නිෂ්පාදන පොදු කාර්ය වියදම් | 400 |
| නිමි භාණ්ඩ මිලට ගැනුම් | 250 |

**අතිරේක තොරතුරු:**

1. 2024.03.31 දිනට තොග- අමුද්‍රව්‍ය 175
   නොනිමි 125
   නිමි ?
2. වර්ෂය තුල දී රු 50 000 ක අමුද්‍රව්‍ය භාවිතය ගත නොහැකි ලෙස විනාශ වී ඇති අතර මේ පිළිබඳ ගැලපීම් සිදුකර නැත.
3. වසර තුළ පරිපාලන කටයුතුවලට සම්බන්ධ සේවකයින් ගෙවන ලද රු 25 000 ක වැටුප් සෘජු වැටුප් තුළ ඇතුළත් වේ
4. විදුලි වියදම 2024.03.31 වන විට රු 15 000 ක් උපචිත වන අතර විදුලි වියදමින් 2/5 ක් පරිපාලන ගොඩනැගිල්ල සඳහා වේ.
5. කර්මාන්ත ශාලා ගොඩනැගිල්ලෙන් 1/3 කොටසක පරිපාලන කාර්යාලය පවත්වාගෙන යන අතර වාර්ෂික ගොඩනැගිලි ක්ෂය රු.75000 සම්පූර්ණයෙන් ම පොදුකාර්යය පිරිවැය තුළ ඇතුලත් කර ඇත.
6. රු.20000 ක නිමි ද්‍රව්‍ය අයිතිකරුවන් පෞද්ගලික ප්‍රයෝජනයට ගෙන ඇත.
7. ව්‍යාපාරය භාණ්ඩ විකුණනු ලබන්නේ පිරිවැය ට 25% ලාභාන්තිකයක් එකතු කර වේ.
8. යන්ත්‍ර හීන වන ශේෂ ක්‍රමය මත 10% බැගින් වාර්ශිකව ක්ෂය කරනු ලබයි.
9. වර්ෂය තුළ ඒකක 120000 ක් නිෂ්පාදනය කර ඇත.ඉන් ඒකක 100000 විකුණා ඇත.(අවසාන නිමි භාණ්ඩ තොගය සමන්විත වන්නේ,නිෂ්පාදනාගාරය තුළ නිපද වූ ඒකක වලින් පමණි)
   අවශ්‍ය වන්නේ,
   1. 2024.03.31 දිනෙන් අවසන් වසර සඳහා නිෂ්පාදන පිරිවැය ලේඛණය පිළියෙළ කර ඒකකයක නිෂ්පාදන පිරිවැය ගනණය කරන්න.
   2. 2024.03.31 දිනින් අවසන් වසර සඳහා දළ ලාභය ගණනය කරන්න.



www.iexamhub.com
Your Trusted Partner for Exam Success
Past Papers Model Answers - Study Resources
iexamhub

06) උවිඳු දිල්ෂාන් ව්‍යාපාරයේ 2024.03.31 දිනට පිළියෙළ කරන පහත තොරතුරු කෙටුම්පත් මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ උපුටා ගෙන ඇත.

| | (රු’000) |
|---|---|
| දේපල පිරියත උපකරණ | 2 300 |
| තොගය | 800 |
| වෙළඳ ලැබිය යුතු ගිණුම් | 500 |
| මුදල් | 600 |
| බැංකු ණය | 1 000 |
| ලද අත්තිකාරම් | 200 |
| වෙළඳ ගෙවිය යුතු ගිණුම් | 200 |
| අවිනිශ්චිත ගිණුම් | ? |

- පසුව සිදු කළ ගිණුම් පරීක්ෂාවකදී පහත සඳහන් වැරදි සහ මග හැරීම් අනාවරණය කරගෙන ඇත.

1. වර්ෂය සඳහා ගෙවූ බැංකු ණය වාරිකය රු 120 000 ක් ණය පොලී ලෙස සටහන් කර තිබුණි. ගෙවූ ණය වාරිකය තුළ ඇතුලත් ණය පොලිය රු 20 000 ක් පමණි.
2. රු 150 000 ක ගැණුම් ඉන්වොයිසියක් පිළිබඳව ගිණුම්ගත කර නොතිබුණි.
3. ණයගැතියන්ගෙන් ලද රු 280 000 ක චෙක්පත් පිළිබඳ ගිණුම්ගත කර නොතිබූ අතර එම චෙක්පත්වලින් රු 150 000 ක චෙක්පත් 2024.03.31 දින වන විටත් උපලබ්ධි වී නොතිබුණි.
4. රු 100 000 ක ආපසු එවුම් දෙවරක් ගිණුම් ගත කර තිබුණි.
5. 2024.03.31 දින මිලට ගත් රු 200 000 ක කාර්යාල උපකරණ, කාර්යාල වියදම් ලෙස හඳුනාගෙන තිබුණි.
6. ලද අතිකාරම් සඳහා රු 130 000 ක් විකුණුම් මිල වූ තොග භාරදීම් පිළිබඳව ගිණුම්ගත කර නොතිබුණි.
7. සැපයුම්කරුවන්ට නිකුත් කරන ලද රු 320 000 ක චෙක්පත් , වෙළඳ ගෙවිය යුතු පාලන ගිණුමේ රු 230 000 ක් ලෙස සටහන් කර තිබූ අතර එම චෙක්පත්වලින් රු 200 000 ක චෙක්පත් 2024.03.31 දිනවන විටත් මුදල් ලබා ගැනීම සඳහා බැංකුවට ඉදිරිපත් කර නොතිබුණි.
8. ණය ගැතියන්ගෙන් ලැබී බැංකුවේ තැන්පත් කරන ලද චෙක්පත් අගරුවීම් රු 130 000 ක් පිළිබඳව ණයගැති පාලන ගිණුමේ පමණක් ලියා ඇත.
9. උවිඳු සිදුකළ භාණ්ඩ ගැනිලි රු 50 000 ක් ගිණුම් ගත කර නොතිබුණි.
10. 2024.03.31 දිනට ලද බැංකු ප්‍රකාශය සමඟ පරීක්ෂා කිරීමේදී සෘජු ණයගැති ප්‍රේෂණ රු 80 000 ක් සහ ප්‍රේෂණ ලාභාංශ රු 20 000 ක් සහ බැංකු ගාස්තු රු 10 000 ක් ව්‍යාපාරය ගිණුම්ගත කර නොතිබූ බව අනාවරණය කරගන්නා ලදී.

**අවශ්‍ය වන්නේ :**

1. ඉහත දැක්වෙන වැරදි නිවැරදි කිරීමේ ජ'නල් සටහන්
2. අවිනිශ්චිත ගිණුම පිළියෙල කර 2024.03.31 දිනට පැවති ශේෂය ගණනය කිරීම.
3. 2024.03.31 දිනට බැංකු සැසඳුම් ප්‍රකාශය පිළියෙල කිරීම



www.iexamhub.com
Your Trusted Partner for Exam Success
Past Papers Model Answers - Study Resources
iexamhub